කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13

ජනවාරි/පෙබරවාරි 2016

**BMGT E1045 / BMGT 13045 – ව්‍යාපාර නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 (අටයි) කාලය : පැය 03

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

01. (අ) 2015 දෙසැම්බර් 25 වෙනි දින සිය කොළඹ පිහිටි නිවසේදී නූතන චිත්‍ර ගණනාවක් විකිණීම සඳහා වෙන්දේසියක් පවත්වනු ලබන බවට චිත්‍රසේන සන්ඩේ එක්ස්ප්‍රස් පුවත්පතේ දැන්වීමක් පළ කරයි. එම වෙන්දේසියට සහභාගීවීම පිණිස වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනයේදී රාජන් යාපනයේ සිට කොළඹට පැමිණ නියමිත වේලාවට චිත්‍රසේනගේ නිවස වෙත ළඟා වුවද එය දොරගුළුලා වසා තිබුණි. එහි වෙන්දේසියක් පැවතුනේද නැත. මෙකී ගමන සම්බන්ධයෙන් ගමන් වියදම් සහ නැවතීමේ ගාස්තු වශයෙන් රාජන්ට රු. 25000 වියදමක් දැරීමට සිදු විය. චිත්‍රසේනට විරුද්ධව ගිවිසුම් කඩ කිරීමේ චෝදනාව මත නඩු පැවරීමට රාජන්ට අවශ්‍යව ඇත. විනිශ්චිත නඩු තීන්දු කෙරෙහි අවධානය යොමු කරමින් රාජන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 08)

(ආ) අගනා ප්‍රතිඥාව යන්න නිර්වචනය කර අගනා ප්‍රතිඥාවක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

02. (අ) ලීවලින් සැකසූ මාරක ලිඳක සිය යතුරු පැදිය ධාවනය කිරීම පිනිස යතුරු පැදි ධාවන ශූරයෙකු වූ මහේන්, සර්කස් සංදර්ශනයක හිමිකරුවෙකු වන පෙරේරා සමඟ ගිවිසුමකට එළඹේ. සිය කුසලතාවයන් පෙළි දැක්වීමට දිනකට පෙර මහේන් අනතුරකට ලක්වන අතර ඔහුට දින 15 ක් රෝහල්ගත වීමට සිදු වේ. පෙරේරාට අදාළ ගිවිසුම අහෝසි කළ හැකිද යන්න විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් පෙන්වා දෙන්න.

(ලකුණු 08)

(ආ) අලාභ ගෙවීම සම්බන්ධයෙන් අදාළ වන්නා වූ රීති මොනවාදැයි සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් හිංසාවට පත් පාර්ශ්වයට ඇති නෛතිකමය ප්‍රතිකර්ම මොනවාද?

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

03. (අ) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ 1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනත මගින් හඳුන්වා දී ඇති විවිධ වූ අධිකරණ මොනවාද?

(ලකුණු 05)

(ආ) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයෙහි අධිකරණ බලය පිළිබඳව විස්තරාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

(මළු ලකුණු 20)

04. (අ) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න හේතු සහිතව සඳහන් කරන්න.

(i) භාණ්ඩ විකුණීමේ ගිවිසුමක් යනු මිලක් සඳහා භාණ්ඩවල හිමිකම විකුණුම්කරු විසින් ගැණුම්කරුට පවරා දෙන හෝ පවරා දීමට එකඟ වන ගිවිසුමකි.

(ii) ''විකිණීමේ ගිවිසුම'' යන පදයට විකිණීමක් හා විකිනීමට එකඟවීමක් යන දෙවර්ගයම අයත් වේ.

(iii) විකිණීමේ ගිවිසුමක ප්‍රතිෂ්ඨාව භාණ්ඩවලින් පමණක්ම යුක්තවිය හැකිය.

(iv) විකිණීමේ ගිවිසුමක විෂය වස්තුව චංචල දේපල විය යුතුය.

(v) දුර්ලභ කාසි, භාණ්ඩ විකිණීමේ ගිවිසුමක විෂය වස්තුව විය හැක.

(ලකුණු 10)

(ආ) පැළ සාම්පලයක් ''මැලේසියානු රඹුටන්'' ලෙස හඳුන්වමින් පැළෑටි තවානක හිමිකරු වූ අමල් විසින් බිමල්ට පෙන්වන ලදි. බිමල් ''මැලේසියානු රඹුටන්'' පැළ 1000 ක් ඇණවුම් කරන ලදි. පැළ තවානේ අයිතිකරු වූ අමල් එම පැළ බිමල්ට සැපයූ අතර ඒවා සාම්පලයට සමාන වුවද ඒවා ''ශ්‍රී ලංකා රඹුටන් පැළ'' බැව් බිමල් විසින් පසුකාලීනව සොයා ගන්නා ලදි. දැන් බිමල්ට, අමල්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍යව ඇත. බිමල්ට අවශ්‍ය උපදෙස් දෙන්න.

(ලකුණු 10)

(මළු ලකුණු 20)

05. (අ) අපරානුමැතිය මත ඇති වන නියෝජ්‍යත්වය යනු කුමක්ද? වලංගු අපරානුමැතියක් මත ඇතිවන නියෝජ්‍යත්වයක් සඳහා සපුරාලිය යුතු අවශ්‍යතාවයන් මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(ආ) නියෝජිතයෙකු තෙවන පාර්ශ්වයක් සමඟ එලඹෙන්නා වූ පහත සඳහන් ගිවිසුම්වල ප්‍රතිඵල කවරේදැයි විස්තර කරන්න.

(i) ප්‍රධානියෙකු වෙනුවෙන් තමා කටයුතු කරන බව නියෝජිත හෙළිදරවු නොකරන විට

(ii) ප්‍රධානියෙකු වෙනුවෙන් තමා කටයුතු කරන බැවු නියෝජිත හෙළිදරව් කරයි. නමුත් සිය ප්‍රධානියාගේ නම හෙළි දරවු නොකරයි.

(iii) ප්‍රධානියෙකු වෙනුවෙන් තමා කටයුතු කරන බවත් සිය ප්‍රධානියාගේ නමක් නියෝජිත හෙළිදරව් කරනවිට,

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

06. (අ) සුගත් ලියනගේ වෙතින් මිලදී ගත් රු. 10 000 ක් වටිනා භාණ්ඩ තොගය ට මිල ගෙවීම පිණිස ඩේවිඩ් පෙරේරා විසින් විනිමය බිල්පතක් ලියන ලදි. සුගත් ලියනගේ එම බිල්පත ''අතුල පෙරේරාට පමණක් ගෙවනු'' වශයෙන් පිටසන් කොට එය අතුල පෙරේරාට භාර දෙන ලදි. දැන් අතුල තමාගෙන් අය විය යුතු ණය මුදලක් පියවීම උදෙසා රොෂාන් වෙත එම බිල පිටසන් කර පැවරීමට අදහස් කරයි. අතුල පෙරේරාට අදාළ බිල්පත රොෂාන් වෙත භාරදීමට හැකිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) ගණුදෙනු කළ හැකි ලියවිල්ලක ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) චෙක්පත් රේඛනය කරන ක්‍රම සහ ඒවායේ ඇති නෛතිකමය බලපෑම විස්තර කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

07. 1971 අංක 45 දරන සේවා නියුක්තිකයන්ගේ සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2(1) වගන්තියට අනුව,

(i) සේවකයාගෙන් කලින් ලබාගත් ලිඛිත කැමැත්තක් නොමැතිව හෝ

(ii) කම්කරු කොමසාරිස් වරයාගෙන් කලින් ලබාගත් ලිඛිත අනුමැතියක් නොමැතිව <u>නිශ්චිත රැකියාවක</u> යෙදුන සේවකයෙකුගේ <u>සේවය අවසන්</u> කළ නොහැක.

(අ) (i) නිශ්චිත රැකියාව

(ii) සේවය අවසන් කිරීම

යනුවෙන් ඔබ කුමක් අදහස් කරයිද?

(ලකුණු 04)

(ආ) මෙම පනත යටතේ කම්කරු කොමසාරිස්වරයාට හිමි බලතල කවරේද?

(ලකුණු 06)

(ඇ) ඉහත පනතින් ආවරණය නොවන සේවකයන් සහ සේවා යෝජකයන් කවරහුද?

(ලකුණු 06)

(ඉ) ඉහත සඳහන් පනත උල්ලංඝණය කරමින් එමගින් ඇතිවන සේවය අවසන් කරනු ලැබුවහොත් එමගින් ඇතිවන ප්‍රතිඵල කවරේද?

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

08. (අ) 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත ඇති කිරීමේ අරමුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ආ) වැටුප් ගෙවීම සහ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පඩිපාලක සභා ආඥා පනතේ අඩංගු විධිවිධානයන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ඇ) පඩිපාලක සභාවක් සංස්ථාපනය සහ එහි බලතල මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(ඉ) දැනට පිහිටුවා ඇති පඩිපාලක සභා 04 ක් නම් කරන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**